මාධ්‍ය නිවේදන - අංක ..59...

මැතිවරණ කොමිෂන් සභාව

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05
## ආගමික ස්ථානවල සිදුකරන මැතිවරණ ප්‍රචාරණ කටයුතු

2020 අගෝස්තු මස 05 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ආගමික ස්ථාන පදනම් කරගෙන සිදුකරන මැතිවරණ ප්‍රචාරණ කටයුතු පිළිබඳ පැමිණිලි මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇත.

02. විශේෂයෙන් කොළඹ/ ගම්පහ/ කළුතර/ හම්බන්තොට හා අම්පාර යන දිස්ත්‍රික්කවලින් ආගමික ස්ථාන යොදා ගනිමින් ප්‍රචාරක කටයුතු සිදුකිරීම පිළිබඳ පැමිණිලි විශාල වශයෙන් ලැබී ඇති අතර ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.

03. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 79 වන වගන්තිය යටතේ ආගමික ස්ථානයක සිදුකරන ප්‍රචාරක කටයුත්තක් හෝ ආගමික රැස්වීමකදී පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂක ප්‍රවර්ධනය වන ආකාරයෙන් හෝ අගතියට පත්වන ආකාරයේ අදහස් ප්‍රකාශ කිරීම "අයුතු බලපෑමක්" වන අතර එය දඬුවම් ලැබිය හැකි වරදක් වේ. එහෙත් ඡන්ද විමසීම් කාලසීමාවක් තුළ පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය කටයුතු සඳහා ආගමික ස්ථාන යොදා ගැනීමට ඉඩ නොදීමට කාරුණික වන ලෙස සහ පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය හෝ අගතියට පත්වන ආකාරයේ කටයුතු සිදුකිරීමෙන් වැළකීමට කාරුණික වන ලෙස සියලුම පූජ්‍ය භික්ෂූන්වහන්සේ වෙතින් සහ සියලුම පැවිදි/ පූජක උතුමාණන්වහන්සේ වෙතින්ද ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

04. ආගමික ස්ථානවල පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධන රැස්වීම් පැවැත්වීමෙන් වළකින ලෙස හා ආගමික මෙහෙයකදී/රැස්වීමකදී කිසිදු ආකාරයක පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනයට හෝ අගතියට හේතුවන අදහස් දැක්වීම ඇතුළු කිසිදු කාර්යයක් සිදු කිරීමට කිසිවකුට අවකාශ ලබා නොදෙන ලෙස සියලුම දේශපාලන පක්ෂ හා කණ්ඩායම් වල බලයලත් නියෝජිතයන්, කණ්ඩායම් නායකයන් අපේක්ෂකයන් හා දේශපාලන ක්‍රියාකාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. යම් හෙයකින් ඉහත ආකාරයේ යම් පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂක ප්‍රවර්ධනය හෝ අගතියට පත්කිරීමක් සිදුවේ නම්, ඒ පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට, දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කළමනාකරණ ඒකකයට හෝ මැතිවරණ කොමිෂන් සභාවේ පිහිටුවා ඇති ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයට දන්වන ලෙස සියලුම පුරවැසියන්ගෙන් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටී.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2020.07. 20